සියලුමහිමිකම්ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Second Term Test – January 2022
දෙවන වාර පරීක්ෂණය - 2022 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time :1hour

| 33 | S | I |
|---|---|---|

## History – I
## ඉතිහාසය – I

Name :- .................................................... Grade : -................ Index number:-....................

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- **මෙම පිළිතුරු පත්‍රයේ දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.**

01. දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර පැරණිම කෘතිය වන දීපවංසය රචනා කර ඇත්තේ,
(1) ක්‍රි.පූ. 4 වන සියවසේදී ය (2) ක්‍රි.ව. 4 වන සියවසේදී ය
(3) ක්‍රි.පූ. 5 වන සියවසේදී ය (4) ක්‍රි.ව. 6 වන සියවසේදී ය

02. මුල් කාලීන දේශීයට සාහිත්‍ය මූලාශ්‍ර පිළිබඳව වඩාත් ගැලපෙන ප්‍රකාශය කුමක් ද?
(1) බොහොමයක් කෘතීන් ලියවී ඇත්තේ ආගමික අරමුණු මුල් කරගෙන ය.
(2) මුල් කාලීන සාහිත්‍ය කෘතීන්වල කතුවරයාගේ නම සඳහන් නොවේ.
(3) කතුවරයා මෙරටට පැමිණ ලියූ කෘතීන් හා නොපැමිණ ලියූ කෘතීන් ලෙස වර්ග කළ හැකි ය.
(4) මුල් කාලීන සාහිත්‍ය කෘතීන් ලියවී ඇත්තේ පාලි භාෂාවෙන් පමණි.

03. ශ්‍රී ලංකාව පිළිබඳව තොරතුරු ලියවී ඇති දකුණු ඉන්දියානු සාහිත්‍ය මූලාශ්‍රයකි.
(1) තිරුක්කුරල් (2) සෙගරාශසේකරමාලෙයි
(3) කෛලාස මාලෛ (4) මනිමේකලෛයි

04. අතීත ජනතාවගේ ආභරණ පරිහරණය, කලා කුසලතාව, රූපලාවණ්‍ය කටයුතු පිළිබඳ තොරතුරු ලැබෙන මූලාශ්‍රයක් ලෙස සැළකිය හැකි වන්නේ,
(1) අභිලේඛන
(2) චිත්‍ර හා මූර්ති
(3) ඓතිහාසික ස්මාරක
(4) ශිලා මංජුසා සොහොන්

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

05. පහත වගුවේ දැක්වෙන්නේ ජනතාව දැනුවත් කිරීම සඳහා රජවරුන් විසින් පිහිටුවන ලද සෙල් ලිපිය. අදාළ රජු සමඟ එම සෙල්ලිපි ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. තෝනිගල සෙල් ලිපිය | A. V වන කාශ්‍යප රජතුමා |
| 2. සොරබොර වැව ලිපිය | B. කීර්ති ශ්‍රී මේඝවර්ණ රජතුමා |
| 3. කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය | C. IV මිහිඳු රජතුමා |
| 4. මිහින්තලා පුවරු ලිපිය | D. IV වන උදය රජතුමා |

(1) B, D, A, C (2) A, C, D, B (3) B, C, A, D (4) C, D, A, B

06. ක්‍රිස්තු පූර්ව 7000-4500 අතර කාල වකවානුවේ ඇතිවූ දේශගුණික විපර්යාස අයත් යුගය වන්නේ,

(1) ප්ලයිස්ටෝසීන යුගයයි (2) නව ශිලා යුගයයි

(3) මහා හිම යුගයයි (4) හොලෝසීන යුගයයි

07. ගංගාවක ගමන් මාර්ගය හරස්කොට අමුණක් බැඳීමෙන් බලාපොරොත්තු වූ ප්‍රධානම අරමුණ වන්නේ,

(1) කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජලය ලබා ගැනීමයි

(2) ජලය සංරක්ෂණය කිරීමයි

(3) විනාශකාරී ගංවතුර පාලනය කිරීමයි

(4) ගංගා නිම්නවල ජනාවාස ඉදිකිරීමට භූමිය ලබා දීමයි

08. 'පුරකමත හා නුරුපුර' ලෙස සඳහන් වූ අභිලේඛන පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ක්‍රි.පූ. 250 ලියවුණු බ්‍රාහ්මී සෙල් ලිපිය හා පනාකඩුව තඹ සන්නස

(2) බුද්දන්නේ හෙළ සෙල් ලිපිය හා සිතුල්පව්ව සෙල් ලිපිය

(3) ක්‍රි.පූ. 250 ලියවුණු බ්‍රාහ්මී සෙල් ලිපිය හා තෝනිගල සෙල් ලිපිය

(4) සොරබොර වැව ටැම්ලිපිය හා වල්ලිපුරම් රන් සන්නස

09. 'තොට බොජක' යනුවෙන් කොත්ගල් කන්ද ලිපියේ දක්වා ඇත්තේ,

(1) ආහාර වර්ගයකි

(2) අය බදු ලබා ගැනීම පිළිබඳවයි

(3) භික්ෂූන් වෙත ගල්ලෙන් පිදීමයි

(4) ආහාර අනුභව කිරීමයි

10. දහනය සඳහා ඔක්සිජන් අවශ්‍ය බව මීට වසර 3000 ට පෙර විසූ ජනයා දැන සිටි බවට ලැබෙන සාක්ෂියකි.

(1) දැදිගම ඇත් පහන

(2) කාල රක්ත මැටි බඳුන් නිර්මාණය

(3) මැටි ඔරු සුසාන වල මැටි නළයක් සවිකර තිබීමයි

(4) කිතුල්ගල බෙලි ලෙනෙන් පිලිස්සූ කැලෑ දෙල් ඇට හමුවීම

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

11. ස්වාධීන ඒකීය රටක් ලෙස කටයුතු කරමින් ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ වීමේ වැදගත්කම දේවානම්පියතිස්ස රජුගේ පහත දැක්වෙන කුමන ක්‍රියාමාර්ගයකින් පිළිබිඹුවේ ද?
    - (1) ශ්‍රී ලංකාවට ආසන්නතම ප්‍රබල රට වූ ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යයා සමඟ මිත්‍ර සම්බන්ධතා පැවැත්වීම
    - (2) පංච කකුධ භාණ්ඩ භාවිතයෙන් දෙවන වතාවටත් රාජාභිශේකය ලැබීම
    - (3) 'දෙවනපිය' යන අභිධානය අශෝක අධිරාජ්‍යයා මෙන් දෙවන රාජාභිශේකයෙන් පසු භාවිතය
    - (4) ශ්‍රී මහා බෝධීන් වහන්සේ රොපණය කිරීමේ උත්සවයට කතරගම හා චන්දනගාමයේ ක්ෂත්‍රියයන්ට ආරාධනා කිරීම

12. 'නරේශ්වර' හා 'චක්‍රවර්තී'' යනු අතීත රජවරුන් තමන් හඳුන්වා ගැනීමට භාවිත කළ රාජ්‍යත්ව සංකල්ප වේ. මෙම සංකල්ප දෙක භාවිත කළ රජවරුන් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
    - (1) දුටුගැමුණු රජතුමා සහ මහසෙන් රජතුමා
    - (2) කුටකණ්ණ අභය රජු සහ භාතිකාභය රජු
    - (3) කුටකණ්ණ අභය සහ නිශ්ශංකමල්ල රජු
    - (4) නිශ්ශංකමල්ල රජු සහ කාශ්‍යප රජු

13. 
    - විවිධ දුක් කම්කටොළු විඳිමින් සැඟව සිටි කුඩා කාලයේ කීර්ති නමින් හැඳින්වීය.
    - ප්‍රථමයෙන් කතරගම ප්‍රදේශයේ රජබවට පත්විය.
    - සංවිධානාත්මක සටන් උපක්‍රම භාවිත කොට චෝලයින් පළවා හැරීය
    - ගනු ලැබූ සෑම තීරණයක්ම රටේ අභිවෘද්ධිය වෙනුවෙන් ගනු ලැබීය.

    ඉහත තොරතුරු වලින් කියවෙන රජු වන්නේ,

    | | |
    |---|---|
    | (1) I වෙනි විජයබාහු රජතුමා | (2) I පරාක්‍රමබාහු රජතුමා |
    | (3) දුටුගැමුණු රජතුමා | (4) II පරාක්‍රමබාහු රජතුමා |

14. පැරණි සමාජයේ වැසියන් තුළ භෞතික විද්‍යාත්මක දැනුමක් පැවති බවට සාක්ෂි ලැබෙන නිර්මාණයක් ලෙස සැළකිය හැකිවන්නේ,
    - (1) 'වජ්‍ර චුම්බට' යන අකුණු සන්නාහකය
    - (2) රුවන්වැලිසෑයේ අත්තිවාරම
    - (3) බිසෝ කොටුව
    - (4) සීගිරියේ ජලමල් නිර්මාණය

15. රටේ දේශීය ආදායම වැඩි කිරීමට කටයුතු කර එම ආදායම භාවිතයෙන් වාරිමාර්ග දියුණු කොට ජනතාවගේ ආර්ථිකය හා ජීවන තත්වය ඉහළ නැංවීමට ගත් පියවරක් ලෙස සැළකිය හැකි වන්නේ,
    - (1) වසභ රජතුමා මහා පරිමාණ වැව් ඉදිකිරීම
    - (2) පරාක්‍රමබාහු රජතුමා පරාක්‍රම සමුද්‍රය ඉදිකිරීම
    - (3) ධාතුසේන රජතුමා කලා වැවේ සිට තිසා වැවට ජලය රැගෙන යාමට යෝධ ඇළ ඉදිකිරීම
    - (4) ඉළනාග රජතුමා කිරිඳි ඔය හරස් කර අමුණක් බැඳීම

සියලුමහිමිකම්ඇවිරිනි / All Rights Reserved

16. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම නිසා ඇතිවූ සංස්කෘතික බලපෑමක් ලෙස සැලකිය හැක්කේ,

(1) බහු ආගමික හා බහු වාර්ගික රටක් වීම

(2) මෝසම් මඟින් වර්ෂාව ලැබීම

(3) සැපවත් දේශගුණයක් ඇති රටක් වීම

(4) චෝළ ආක්‍රමණයන්ට නිතර ලක් වීම

17. ඇළහැර ඇළ මඟින් ජලය සැපයූ වැව් පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) මින්නේරිය වැව, පදවිය වැව, හුරුළු වැව, තිසා වැව

(2) මින්නේරිය වැව, ගිරිතලේ වැව, කවුඩුල්ල වැව,කන්තලේ වැව

(3) යෝධ වැව, කලා වැව, ගිරිතලේ වැව, කන්තලේ වැව

(4) මින්නේරිය වැව, තිසා වැව, කවුඩුල්ල වැව, කන්තලේ වැව

18. ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහත දක්වා ඇත.

A - ඉබන් බතූතා මෙරටට පැමිණීම

B - පාහියන් භික්ෂුව අභයගිරියේ නේවාසිකව අධ්‍යාපනය ලැබීම

C - පණ්ඩුකාභය රජු ග්‍රාම සීමා නියම කිරීම

D - රොබට් නොක්ස් සිරභාරයට පත්වීම

ඉහත සිදුවීම් කාල අනුපිළිවෙලට ගැළපූ විට පිළිතුර වන්නේ,

(1) C, B, A, D (2) B, C, D, A

(3) A, C, B, D (4) B, A, D, C

19. අතීත සමාජයේ බදු අයකර ගැනීම සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) ලැබෙන අස්වැන්නෙන් ගෙඩි 10කට එකක් ලෙස බදු ගෙවීමට සිදුවීම

(2) රජයේ ඉඩම් පරිහරණයට හා ජලය භාවිත කිරීමට බදු ගෙවිය යුතුවීම

(3) විදේශවලින් භාණ්ඩ ආනයනයේදී රේගු බදු අය කිරීම

(4) බදු ගෙවීම් පැහැර හරින්නන් සඳහා දඬුවම් ලබාදීමත් සිදුවූයේ නැත.

20. අතීතයේ මෙරට දියුණු වෛද්‍ය තාක්ෂණයක් පැවති බවට ලැබෙන ප්‍රබලම සාක්ෂියක් ලෙස සැළකිය හැකි වන්නේ,

(1) බුද්ධදාස රජතුමා සතුන්ට පවා වෙදකම් කළ වෛද්‍යවරයකු වීම

(2) ආලාහන පිරිවෙන අසලින් ශල්‍ය උපකරණ හමුවීම

(3) අතීත රජවරු මාතෘ නිවාස හා උණ රෝහල් ඉදිකර තිබීම

(4) අතීතයේ පැවති ඔසු උයන් හා පුරාණ වෛද්‍ය පුස්තක පිළිබඳ තොරතුරු ලැබීම

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

❖ **පහත දැක්වෙන රජවරු අධ්‍යයනය කොට 21 සහ 22 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - දුටුගැමුණු රජතුමා

B - IV පරාක්‍රමබාහු රජතුමා

C - II පරාක්‍රමබාහු රජතුමා

D - I විජයබාහු රජතුමා

E - මහසෙන් රජතුමා

F - වසභ රජතුමා

21. වාරි කර්මාන්තයට විශිෂ්ට සේවාවක් කල රජවරු දෙදෙනා වන්නේ,

(1) A සහ E (2) C සහ F

(3) B සහ E (4) E සහ F

22. චෝල ආක්‍රමණ මැඩ පවත්වා රට එක් සේසත් කරනු ලැබූ රජවරු වන්නේ,

(1) A සහ B (2) A සහ D

(3) C සහ B (4) B සහ D

23. යාපහුව රාජධානියේ දළදා මන්දරයේ පියගැට පෙල හා එහි කුළුණු නිර්මාණය සඳහා ආභාෂය ලැබී ඇති රටවල් වන්නේ,

(1) පාණ්ඩ්‍ය දේශය හා මියන්මාරය (2) පාණ්ඩ්‍ය දේශය හා කාම්බෝජය

(3) කාලිංග දේශය හා කාම්බෝජය (4) කාම්බෝජය හා චීනය

24. යාපනය රාජධානිය 1591 ආක්‍රමණය කළ පෘතුගීසීහු එහි පාලනය සඳහා පත්කළ ඔවුන්ට පක්ෂපාතී පාලකයා වන්නේ,

(1) පරරාජසේකරම් (2) II සංකිලි රජතුමා

(3) සුවිරාජපණ්ඩරම් (4) එදිරිමාන්නසිංහම්

25. 1602 දී සිදුවූ පෘතුගීසි උඩරට ආක්‍රමණය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) සටන සිදුවූයේ අසවේදු සෙන්පතියා සහ II රාජසිංහ රජු අතරය

(2) සටන සිදුවූයේ ද ලසර්දා සහ I රාජසිංහ රජු අතර ය

(3) සටන සිදුවූයේ අසවේදු සෙන්පතියා සහ I විමලධර්මසූරිය රජු අතර යි

(4) සටන සිදුවූයේ සෙනරත් රජු සමග මහා අස්ථාන කුමරුන් හා දියෝගු ද මේලෝ කුස්තෝ සෙන්පතියා අතර ය.

සියලුමහිමිකම්ඇවිරිනි / All Rights Reserved

26. ලන්දේසීන් මෙරට මුහුදුබඩ පළාත් පාලනය කිරීමේදී උඩරට රාජ්‍යය සමඟ ගැටුම් අවම කර ගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලැබුවේ කුමන හේතුවක් නිසා ද?
   (1) උඩරට රජවරුන් සතුව පැවති යුධ ශක්තියට මුහුණදීමට බියවූ නිසා
   (2) වියදම් අඩුකර ගැනීම ලන්දේසින්ගේ ප්‍රතිපත්තිය වීම නිසා ය
   (3) උඩරටට පිවිසීමේදී හමුදාවන්ට විවිධ දුෂ්කරතාවන්ට මුහුණු දීමට සිදුවීම
   (4) උඩරට රජවරු හා ලන්දේසීන් අතර ඇතිකරගත් ගිවිසුම්වලට අනුව ලන්දේසීන් ක්‍රියා කිරීම

27. මහනුවර රාජධානියේ රජතුමාට පසු ඉහළම දේශපාලන බලතල හිමිවූයේ
   (1) දියවඩන නිළමේතුමාට ය (2) අධිකාරම්වරුන්ට ය
   (3) දිසා ඒජන්තවරයාට ය (4) දිසාවේවරුන්ට ය

❖ **28 සහ 29 යන ප්‍රශ්නවලට පහත දක්වෙන තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

A - පන්සිය පණස් ජාතක පොත සිංහලයට පරිවර්තනය වීම
B - චෙං හෝ සෙනෙවියාගේ ආක්‍රමණය සිදුවීම
C - කාළිංගරායර හා චෝඩගංගගේ ආක්‍රමණය සිදුවීම
D - ප්‍රධාන ප්‍රභූ පවුල් 2ක් බලවත් වීම
E - බෝසත් විජයබාහු රජු මරණයට පත්වීම
F - උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා උපසම්පදාව රැගෙන මෙරටට වැඩම කිරීම

28. ඉහත දක්වූ තොරතුරු අතරෙන් ගම්පොළ රාජධානිය සම්බන්ධ තොරතුරු පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
   (1) B සහ D (2) C සහ D
   (3) B සහ E (4) A සහ F

29. දඹදෙණිය රාජ්‍යය සම්බන්ධ තොරතුරු පමණක් ඇතුලත් පිළිතුර ලෙස සැලකිය හැක්කේ,
   (1) A සහ C (2) B සහ D
   (3) C සහ E (4) D සහ F

30. මෙරට ප්‍රථම කෘෂිකර්ම ඇමතිවරයා ලෙස ඩී.එස්. සේනානායක මහතා පත් කරනු ලැබුවේ,
   (1) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මඟින් ය
   (2) ක්‍රෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මඟින් ය
   (3) කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මඟින් ය
   (4) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ ය

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

❖ **31 සිට 32 දක්වා ප්‍රශ්නවලට පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගන්න.**

A- අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම

B- අග්‍රාණ්ඩුකාර තනතුර හඳුන්වාදීම

C- ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම

D- පූර්ණ බලතල සහිත විධායක ජනාධිපතිධුරය හඳුන්වාදීම

E- විධායක කාරක සභා පිහිටුවීම

F- සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම

31. ඉහත සඳහන් තොරතුරු අතර කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඇතුළත් පිළිතුර වන්නේ,

(1) B සහ F (2) C සහ D

(3) A සහ C (4) A සහ E

32. 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් තොරතුරු දැක්වෙන පිළිතුර වන්නේ,

(1) B සහ D (2) C සහ D

(3) A සහ D (4) D සහ F

33. 1972 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධව පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සිලයට ලබා දී තිබූ අභියාචනා නඩු විසඳීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය පවරණ ලදී

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 පරිච්ඡේදයේ මූලික මිනිස් අයිතිවාසිකම් දක්වා තිබුණි

(3) බ්‍රිතාන්‍ය රජු හෝ රැජින තව දුරටත් රාජ්‍ය නායකයා හෝ නායිකාව ලෙස සලකනු ලැබීය

(4) අගමැතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලය පත් කරනු ලබයි

34. රටේ සියලුම දරුවන්ට නොමිලයේ අධ්‍යාපනය ලබා දීමට යෝජනා වූයේ,

(1) රාජ්‍ය මන්ත්‍රණ සභාව පැවති යුගයේදී ය

(2) 1978 නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ය

(3) ද්වී මණ්ඩල පාර්ලිමේන්තුව යටතේ ය

(4) ජාතික රාජ්‍ය සභාව යටතේ ය

35. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ප්‍රථම කාර්මික ජනපදය පිහිටවනු ලැබුවේ,

(1) බියගම යි (2) කොග්ගල යි

(3) ඒකල ය (4) කටුනායක

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

36. කෝපි වගාව අසාර්ථක වීම නිසා තේ වගාව මෙරටට හඳුන්වා දෙනු ලැබුවේ,
(1) ජේම්ස් ටේලර් විසිනි
(2) එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයා විසිනි
(3) ස්ටුවඩ් මැකන්සි ආණ්ඩුකාරවරයා විසිනි
(4) හෙන්රි වෝඩ් විසිනි

37. ''1915 ඇතිවූ කෝලහලයේ දී අසාධාරණයට ලක්වූවන් වෙනුවෙන් සිය හඬ අවදි කළ මෙතුමා ව්‍යවස්ථාදායක සභාවට පත් වූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා බවට පත්විය'' මේ ප්‍රකාශයෙන් කියවෙන්නේ,
(1) අනාගාරික ධර්මපාලතුමා පිළිබඳවයි
(2) පොන්නම්බලම් රාමනාදන් මහතා පිළිබඳවයි
(3) පොන්නම්බලම් අරුණාචලම් මහතා පිළිබඳවයි
(4) ආතර් වී. දියෙස් මහතා පිළිබඳවයි

38. පුනරුද සමයේ චිත්‍ර කලාවේ දක්නට ලැබුණු පැහැදිලි වෙනසක් වූයේ,
(1) ලෞකික රස වින්දනය හා ස්වභාවිකත්වයට මුල් තැන දෙමින් නිර්මාණ බිහිවීම
(2) චිත්‍ර ශිල්පීන් ශ්‍රේණි වශයෙන් සංවිධානය වී නිර්මාණකරණයේ යෙදීම
(3) ධනවත් පුද්ගලයින්ගේ රූප සිතුවමට නැගීමට වැඩි අවධානයක් ලබා දීම
(4) කතෝලික ආගමට සම්බන්ධ සාන්තුවරුන්ගේ රූප චිත්‍රයට නැගීමට වැඩි අවධානයක් යොමු වීම

39. කාර්මික විප්ලවය එංගලන්තයේ ආරම්භවීමට බලපෑ ප්‍රධානතම හේතුව ලෙස සැලකිය හැකි වන්නේ,
(1) එරට වැඩවසම් ක්‍රමය බිඳ වැටීමයි (2) නව ධනවතුන් බිහිවීමයි
(3) බැංකු කටයුතුවල දියුණුවයි (4) අමුද්‍රව්‍ය එරට සුලභවීමයි

40. කාර්මික විප්ලවයේ නව සොයාගැනීම් හා එම සොයා ගැනීම් සිදුකළ පුද්ගලයින් තීරු අංක 01 සහ තීරු අංක 02 දක්වා ඇත. එම තීරු දෙක ගැලපූ විට පිළිතුර තෝරන්න.

| I | II |
|---|---|
| 1. ආරක්ෂක ලාම්පුව | A. ඩෙම්ලර් |
| 2. මෝටර් රථය | B. සැමුවෙල් මෝස් |
| 3. ගුවන් විදුලිය | C. හම්ප්‍රි ඩේවි |
| 4. විදුලි පණිවුඩ ක්‍රමය | D. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් |
| | E. ගුග්ලිමෝ මාර්කෝනි |

(1) A, C, B, D (2) C, E, A, B
(3) C, E, B, A (4) C, A, E, B

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

**Royal College - Colombo 07**
රාජකීය විද්‍යාලය - කොළඹ 07

**Grade 11 – Second Term Test – January 2022**
**දෙවන වාර පරීක්ෂණය - 2022 ජනවාරි - 11 ශ්‍රේණිය**

කාලය : පැය2
**Time :2 hours**

| 33 | S | II |
|---|---|---|

# History – II
# ඉතිහාසය – II

Name :- .................................................. Grade : -................ Index number:-....................

**සැලකිය යුතු ය**

- **පළමුවන කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.**
- **II කොටසින් ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි**

## I- කොටස

01.

(අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහිද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) උඩවළව ජලාශය, ඉරණමඩු වැව, දදුරු ඔය, පරාක්‍රම සමුද්‍රය, මාගම, දඹදෙණිය, මන්නාරම් දූපත, කුදිරමලේ, ගන්නෝරුව, කුඹුක්කන් ඔය, කැලණිය, දඹකොළ පටුන (ලකුණු 12)

(ii) කැලිකට්, මදුරාසිය, මැලේසියාව, පෘතුගාලය, ලන්ඩන්, රෝමය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ඩිමුන්ඩෝ කෘතිය රචනා කළ පුද්ගලයා

B - ඉංග්‍රීසීන් පැමිණෙන විට සිටි උඩරට පාලකයා

C - පුනදරුදයේ කලා නිර්මාණ නිසා ප්‍රසිද්ධියට පත් ඉතාලි නගරය

D - II පරාක්‍රමබාහු රජුට ළමා කල රැකවරණය සැපයූ භික්ෂූන් වහන්සේ (ලකුණු 04)

A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A රූපය



(ii)
1. ''A" වලින් දක්වා ඇති රූපය නම් කරන්න.
2. එය සොයා ගත් ප්‍රදේශය නම් කරන්න.
3. එය අයත්වන ආගමික නිකාය කුමක් ද?
4. එම නිකායට අයත් පුද්ගලයින් පැමිණි රට කුමක් ද?

(ලකුණු 04)

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

(iii) 1. ''B'' වලින් දැක්වෙන රූපය කුමක් ද?
2. එය පිහිටා ඇති ප්‍රදේශය නම් කරන්න.
3. එම නිර්මාණය තැනීම සඳහා යොදාගෙන ඇති ද්‍රව්‍ය නම් කරන්න.
4. මෙම නිර්මාණය ඇසුරෙන් අතීත තාක්ෂණය පිළිබඳව ලැබෙන තොරතුර කුමක් ද?

B රූපය



(ලකුණු 04)

## II - කොටස

02. (i) ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ තොරතුරු ලැබෙන පහත සඳහන් ස්ථාන අයත් පරිසර කලාප නම් කරන්න. (ලකුණු 03)

A - බෙල්ලන්බැඳි පැලැස්ස

B - රාවණා ඇල්ල

C - පතිරාජවෙල

(ii) ශ්‍රී ලංකාවට පැමිණ තොරතුරු ලියූ විදේශීය ලේඛකයින් අතරින්,

A - අරාබි මූලාශ්‍රය

B - චීන මූලාශ්‍රය

C - පෘතුගීසි මූලාශ්‍රය

D - ඕලන්ද මූලාශ්‍රය අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉතිහාසය අධ්‍යයනයේදී සෙල්ලිපිවල වැදගත්කම කරුණු 2ක් ඇසුරින් ලියන්න. (ලකුණු 05)

(iv) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අභිචාර විධි 3ක් නම් කර විස්තර කරන්න. (ලකුණු 06)

03. (i) ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කිරීම සඳහා ස්ථාන තෝරා ගැනීමේදී අවධානය යොමු කළ කරුණු 3ක් ලියන්න. (ලකුණු 03)

(ii) පහත A, B, C, D වලින් දැක්වෙන නිලධාරින්ට භාරවූ කාර්යයන් නම් කරන්න.

A - කනපෙඩික B - බඩගරික

C - කොතුරුගැනා D - අඩික (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ ලක්ෂණ 3ක් දක්වා ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) වසභ රජතුමා මහා පරිමාණ වාරි මාර්ග බිහි කිරීමට හේතු 2ක් දක්වා විස්තර කරන්න. (ලකුණු 06)

සියලුමහිමිකම්ඇවිරිනි / All Rights Reserved

04. (i) පහත දැක්වෙන ඇළ මාර්ග ඉදිකල රජවරු අනුපිළිවෙළින් නම් කරන්න.

A - මිනිපේ ඇළ

B - යෝධ ඇළ

C - ඇළහැර ඇළ (ලකුණු 03)

(ii) පහත A, B, C, D යටතේ අසා ඇති තොරතුරු අනුපිළිවෙලින් දක්වන්න.

A - නිශ්ශංක අලකේශ්වර ඉදිකල බලකොටුව

B - ආර්ය චක්‍රවර්තී පරපුරේ ආරම්භක රජු

C - වියළි කලාපයේ තැනින් තැන බිහිවූ කුඩා පාලන ඒකක

D - තෑගි ඔප්පුවකින් සිය රාජ්‍ය උරුමය පෘතුගීසින්ට පැවරූ රජතුමා (ලකුණු 04)

(iii) තුන්වන විජයබාහු රජුගේ සේවාවන් 3ක් ලියා ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දෙවන නාගරීකරණයේදී මහා පරිමාණ වාරිමාර්ග බිහි නොවීමට හේතු 3ක් ලියා විස්තර කරන්න. (ලකුණු 06)

05. (i) 16 වන සියවසේ පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට මෙරට පැවති පාලන මධ්‍යස්ථාන 3 නම් කරන්න. (ලකුණු 03)

(ii) වැවක පහත දැක්වෙන තාක්ෂණික අංශවලින් ඉටුවන කාර්යයන් නම් කරන්න.

A - වැව් බැම්ම B - රළපනාව

C - පිටවාන D - බිසෝ කොටුව (ලකුණු 04)

(iii) දෙවන නාගරීකරණයේ ගෘහ නිර්මාණවල දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ 2ක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අතීතයේ මෙරට දියුණු වෛද්‍ය සේවාවක් පැවති බවට උදාහරණ 3කින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. (i) බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් උඩරට ප්‍රදේශයේ වගා කළ වැවිලි බෝග 3ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) A - ක්‍රි.ව.1619 දී යාපනය රාජ්‍යය ආක්‍රමණය කළ පෘතුගීසී සෙන්පතියා

B - දෝන කතිරිනා නමින් හැඳින්වූ උඩරට රාජ්‍යයේ උරුමක්කාරිය

C - පෙතංගොඩ උයනේදී උණ කටුවක් කකුලේ ඇනීම නිසා ඇතිවූ තුවාලයෙන් මියගිය රජතුමා

D - පෘතුගීසි සෙන්පතියකු අත්වැරදීමකින් සිදුකළ වෙඩි පහරකින් මියගිය රජතුමා (ලකුණු 04)

(iii) 1848 නිදහස් අරගලයට හේතු වූ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ 2ක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) 1815 උඩරට ගිවිසුමෙන් වසර 3ක් ගතවන විටම නිදහස් අරගලයක් ඇතිවීමට බලපෑ හේතු 3ක් විස්තර කරන්න. (ලකුණු 06)

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

07. (i) A - පළාත් බද ඡන්ද කොට්ඨාශ ක්‍රමය හඳුන්වා දීම

B - උගත් ලාංකිකයන් වෙනුවෙන් නියෝජිතයකු පත් කිරීම

C - ජනවාර්ගික නියෝජනය අහෝසි කිරීම

ඉහත දැක්වූ වෙනස්කම් සිදුකල ආණ්ඩුක්‍රම ප්‍රතිස්කරණ අනුපිළිවෙළින් ලියන්න.

(ලකුණු 03)

(ii) පහත A, B, C, D යටතේ අසා ඇති තොරතුරු ලියන්න

A - මෙරට ආරම්භ කළ පළමු බහු කාර්යය යෝජනා ක්‍රමය

B - වික්ටෝරියා ජලාශය ඉදිකිරීමට විදේශාධාර සැපයූ රට

C - 1961 කුඩා කර්මාන්තකරුවන්ට ණය ලබාදීමට පිහිටවූ දේශීය බැංකුව

D - පළමු මහවැලි සංවර්ධන අමාත්‍යවරයා (ලකුණු 4)

(iii) නිදහසෙන් පසු මෙරට කර්මාන්ත ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා බලයට පත්වූ රජයන් ගත් ක්‍රියාමාර්ග 2ක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) බ්‍රිතාන්‍ය පාලනය යටතේ මෙරට සිදුවූ වෙනස්කම් කරුණු 3ක් යටතේ විස්තර කරන්න.

(ලකුණු 06)

## II - කොටස

08. (i) යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු 3ක් ලියන්න. (ලකුණු 03)

(ii) පහත දැක්වෙන සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙළින් නම් කරන්න.

A - පල්ලියේ ආධිපත්‍යය විවේචනය කළ ජර්මන් ජාතික මහාචාර්යවරයා

B - මොනාලිසා නම් විශ්ව කලා කෘතියේ නිර්මාපකයා

C - රුධිර සංසරණය පිළිබඳ සොයාගත් වෛද්‍යවරයා

D - දුරේක්ෂය නිපදවූ තැනැත්තා (ලකුණු 4)

(iii) පුනරුදය නිසා යුරෝපයේ ඇතිවූ දේශපාලන නවෝදය කරුණු 2ක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දේශගවේෂණයේ ප්‍රතිඵල 3ක් විස්තර කරන්න. (ලකුණු 06)

09. (i) යටත් විජිත අත්පත්කරගෙන සිටි යුරෝපා රටවල් 3ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) කාර්මික විප්ලවය එංගලන්තයෙන් ආරම්භවීමට බලපෑ හේතු 4ක් ලියන්න.

(ලකුණු 4)

(iii) කාර්මික විප්ලවය නිසා ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇතිවූ දියුණුව උදාහරණ 2ක් මඟින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වර්ධනයට කාර්මික විප්ලවය හේතු වූ ආකාරය නිදසුන් 3ක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 06)